# 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

**කොන්දේසි**

1. ව්‍යාපාරයේ ලියාපදිංචි නම, ලිපිනය, දුරකථන අංක, ෆැක්ස් අංක , විද්‍යුත් තැපැල හා වෙබ් අඩවිය පිළිබඳ විස්තර සැපයිය යුතුය.
2. ව්‍යාපාර නාම ලියාපදංචි සහතිකය , වැට් බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම සඳහා ලියාපදිංචි සහතිකය හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA/ICTAD) ලියාපදිංචි සහතික වල ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.
3. මෙම සේවාව **2024 වර්ෂය** සඳහා පමණක් වලංගු වේ.
4. ලියාපදිංචි වන සියලුම සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ලියාපදිංචි විය යුතුය.
5. එක් අයිතමයක් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව **රු.1,000.00කි**.
   කොන්ත්‍රාත්කරුවන් විසින් ඒ ඒ වටිනාකම ඉදිරියෙන් සඳහන් ගාස්තු ගෙවිය යුතුය. එම මුදල කාර්යාල දිනවල **පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා** ගෙවා රිසිට්පතක් ලබා ගත හැක. නැතහොත් චෙක්පතකින් **“ලේකම්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව , කලේගාන, ගාල්ල”** නමින් එවිය යුතුය. (මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)
6. ලියාපදංචි සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවස්ථානුකූලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැහැරව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුවේ.
7. ඉල්ලුම් කළ විට මිල ගණන් ඉදිරිපත් නොකරන , නිසි වේලාවට භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත්වන , නියමිත ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ හා සේවා සපයනු නොලබන හා මිල ගණන් කැඳවීමේ කොන්දේසිවලට ක්‍රියා නොකරනු ලබන සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කොට අසාධු ලේඛනගත කරනු ලැබේ.
8. භාණ්ඩ හා සේවා සැපයීමේදී ආඥා පනත් , මුදල් රෙගුලාසි හ මූල්‍ය රීති අනුවද , රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් ලිපි ප්‍රකාරව හා ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන කොන්දේසි වලටද එකඟ විය යුතුය.
9. සැපයුම්කරුවන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතුවන අතර, මේ පිළිබඳ ප්‍රාදේශීය සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ.